PE/TECH/D/06/01 2016.03.04

**චක්‍රලේඛ: පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති විධාන අංක 01**

සභාපති
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

## <u>පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කඩිනම් කිරීම</u>

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 58 වන වගන්තිය යටතේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා වශයෙන් මා හට පැවරී ඇති බලතල අනුව මෙම විධාන චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

රජයේ විදුලිබල සංවර්ධන ප්‍රතිපත්තිය අනුව පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. රජයේ ප්‍රතිපත්තිය වන්නේ ශ්‍රී ලංකාවට අවශ්‍ය සමස්ථ විදුලිබල හා බලශක්ති අවශ්‍යතාවය පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් ලබා ගැනීමයි. මේ අනුව, වසර 2020 වනවිට සමස්ථ විදුලිබල නිෂ්පාදනයෙන් 60%ක් පමණ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් ලබා ගැනීමටත්, වසර 2030 වන විට මෙය 70% දක්වා වැඩි කිරීමටත්, වසර 2050 වන විට ශ්‍රී ලංකාව බලශක්තියෙන් ස්වයංපෝෂිත තත්වයට පත් කිරීමේ පුළුල් දර්ශනයක් ඔස්සේ රටේ බලශක්ති අංශය සංවර්ධනය කිරීමට රජය සැලසුම් කර ඇත.

මෙහි එක් පියවරක් වශයෙන් දැනට විවිධ හේතු මත ඇණහිට තිබෙන සූර්යබල, සුළංබල හා කුඩා ජල විදුලි බලාගාර වැනි පුනර්ජනීය බලශක්ති විදුලිබල ව්‍යාපෘති මුහුණ දී ඇති ගැටළු හඳුනාගෙන එම ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට රජය සැලසුම් කර ඇත.

ඒ අනුව 2016 අයවැය යෝජනා මගින් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපි ලබාගෙන 2015 දෙසැම්බර් 31 දිනට වසරකට වඩා වැඩි කාලයක් ගත වුව ද මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති ව්‍යාපෘති අවලංගු කිරීමට තීරණය කර ඇත. මේ තුළින් දැනට තාවකාලික අනුමැති සහ බලපත්‍ර ලබාගෙන ආයෝජන මුදල් නොමැතිවීම හෝ වෙනත් ගැටළු නිසා ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති අවලංගු කර එම ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා ආයෝජන හැකියාවන් ඇති ආයෝජකයින්ට ලබා දීමට පියවර ගත යුතුය.

මෙම තත්වය සැලකිල්ලට ගෙන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කඩිනම් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග වහාම ක්‍රියාත්මක කරන ලෙස මෙමඟින් උපදෙස් දෙනු ලැබේ.

### <u>බලපත්‍ර (Permit) අවලංගු කිරීම</u>

1. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ (මින් ඉදිරියට පනත) 21 සහ 22 වගන්තිවල පවතින විධිවිධාන එලෙසම ක්‍රියාත්මක කළ යුතුය.

2. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා පනතේ 18 (2) (අ) යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් (මින් ඉදිරියට බලපත්‍රය) ලබාගෙන අවු 02ක් තුළ විදුලිය නිෂ්පාදනය ආරම්භ කර නැති සියලුම ව්‍යාපෘතිවලට අදාළ බලපත්‍ර, පනතේ 21 (2) වගන්තිය ප්‍රකාරව සංවර්ධනකරුට කරුණු ඉදිරිපත් කිරීම සඳහා දින 14ක කාලයක් ලබා දීමෙන් පසු, බලපත්‍ර කාලය අවසන් වී මසක් ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන අවලංගු කළ යුතුය.

3. සංවර්ධනකරු ඉදිරිපත් කරන කරුණු පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වේ නම්, ඒ පිළිබඳව අධ්‍යයනය කර නිර්දේශ ලබා දීම සඳහා මෙම චක්‍රලේඛයේ 5 වන ඡේදය යටතේ පත්කරනු ලබන උපදේශක කමිටුවට ඉදිරිපත්කළ යුතුය.

4. ඉහත සඳහන් 2වන ඡේදය මගින් බලපත්‍රයක් අවලංගු කිරීම නිසා අතෘප්තියට පත් පාර්ශවයකට බලපත්‍රය අවලංගු වී මාසයක් ඇතුළත පනතේ 22 වන වගන්තිය අනුව, කළමනාකරණ මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

5. **(අ).** ඉහත 4 වන ඡේදය අනුව ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳ අධ්‍යයනය කර නිර්දේශ ලබාදීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත උපදේශක කමිටුවක් පනතේ 9 වන වගන්තිය අනුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පත් කළ යුතුය.

   (i) පුනර්ජනනීය බලශක්ති විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයෙක් - කමිටු සභාපති

   (ii) ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී හෝ අතිරේක සාමාන්‍යාධිකාරී මට්ටමේ නිලධාරියෙක් - කමිටු සාමාජික

   (iii) සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපතිවරයා - කමිටු සාමාජික

   (iv) පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති විශේෂඥයෙක් - කමිටු සාමාජික

   (v) ඉංජිනේරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති විශේෂඥයෙක් - කමිටු සාමාජික

   (vi) නීති ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති විශේෂඥයෙක් - කමිටු සාමාජික

   (vii) සමාජයීය / ආර්ථික ක්ෂේත්‍ර පිළිබඳ දැනුම ඇති විශේෂඥයෙක් - කමිටු සාමාජික

   **(ආ).** මෙම කමිටුවේ කැඳවුම්කරු සහ කමිටු ලේකම් ලෙස සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කළ යුතුය.

   **(ඇ).** උපදේශක කමිටුව විසින් අභියාචනා සම්බන්ධ තීරණය මාසයක කාලයක් තුළ කළමනාකරණ මණ්ඩලය වෙත ලබා දිය යුතුය.

6. උපදේශක කමිටුව ව්‍යාපෘතිය පවත්වාගෙන යාම නිර්දේශ කරන්නේ නම්, එම ව්‍යාපෘතිය විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් ලියාපදිංචි කර විශේෂ බලපත්‍රයක් ලබාගැනීම සඳහා සංවර්ධනකරු විසින් දින 14ක් ඇතුළත අයදුම් කළ යුතු වේ.

7. ඉහත 6 වන ඡේදය යටතේ ව්‍යාපෘතියක් විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළවිට කළමණාකරණ මණ්ඩලය විසින් ව්‍යාපෘතිය අවසන් කිරීමට වසරක කාලයක් සඳහා විශේෂ බලපත්‍රයක් ලබා දිය හැකිය.

8. මෙහි 7 වන ඡේදය අනුව විශේෂ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ව්‍යාපෘතියට අදාළ බලපත්‍රය ලබා ගැනීමට යොදාගත් සියලු අනුමැතීන් භාවිතා කළ හැකි අතර විශේෂ බලපත්‍රය නිකුත් කිරීම සඳහා ගාස්තුවක් අයකළ හැකිය.

9. ඉහත සඳහන් 7 වන ඡේදය යටතේ නිකුත් කරනු ලබන විශේෂ බලපත්‍රයේ වලංගු කාලසීමාව වන වසරක කාලය ඉකුත් වීමෙන් පසු තවත් වසරක උපරිමයකට යටත් කාලසීමාවක් සඳහා විශේෂ බලපත්‍රය දීර්ඝ කර ගැනීමට සංවර්ධනකරුට ඉල්ලුම්කල හැකිය. කෙසේ වෙතත්, විශේෂ බලපත්‍රයේ වලංගු කාලසීමාව දීර්ඝ කරනු ලබන කාලසීමාවට සමාන කාලයක් තුළ විදුලි ජනනය මගින් ඔහුට හිමිවිය යුතු මුදලින් 50%ක කොටසක් අඩුකර ගැනීමට සංවර්ධනකරු විසින් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීමෙන් පසු පමණක් විශේෂ බලපත්‍රයේ වලංගු කාලසීමාව දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම් කළ හැකිය. කිසියම් හේතුවක් නිසාවත් විශේෂ බලපත්‍රය වසරකට වැඩි කාලයකට දීර්ඝ නොකළ යුතුය.

## තාවකාලික අනුමැතිය (Provisional Approval) අවලංගු කිරීම

10. පනතේ 17 වගන්තිය යටතේ නිකුත් කරන ලද තාවකාලික අනුමැතියක් කාලය අවසන් වී 2011 අංක 1705/22 දරන ජාලගත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති නියෝග යටතේ තවත් වසරක කාලයක් දීර්ඝ කර ඇති තාවකාලික අනුමැතියකට අදාළ ව්‍යාපෘති සංවර්ධනකරුට කරුණු ඉදිරිපත් කිරීම සඳහා දින 14ක කාලයක් ලබා දීමෙන් පසු තාවකාලික අනුමැතියේ කාලය අවසන් වී මසක් ඇතුලත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන අවලංගු කළ යුතුය.

11. සංවර්ධනකරු විසින් ඉදිරිපත් කරන කරුණු පිලිබඳ සෑහීමකට පත්වන අවස්ථාවේදී, ඒ පිළිබඳ අධ්‍යයනය කර නිර්දේශ ලබා දීම සඳහා පනතේ 10 (1) වගන්තිය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කළ යුතු වේ.

12. ඉහත සඳහන් 10 වන ඡේදය මගින් තාවකාලික අනුමැතියක් අවලංගු කළ නිසා අතෘප්තියට පත්වන පාර්ශවයකට තාවකාලික අනුමැතිය අවලංගු වී මසක් ඇතුළත කළමනාකරණ මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

13. මෙහි 12 වන ඡේදය යටතේ ඉදිරිපත් කරන අභියාචනයක් පිලිබඳ අධ්‍යයනය කර නිර්දේශ ලබා දීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුවට යොමු කළ යුතුය.

14. ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව ව්‍යාපෘතිය පවත්වාගෙන යාම නිර්දේශ කරන්නේනම්, එම ව්‍යාපෘතිය විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් ලියාපදිංචි කර විශේෂ තාවකාලික අනුමැතියක් ලබා ගැනීම සඳහා සංවර්ධනකරු විසින් දින 14ක් ඇතුළත අයදුම් කළ හැකිය.

15. ඉහත 14 වන ඡේදය යටතේ ව්‍යාපෘතියක් විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළ විට බලපත්‍රය ලබා ගැනීමට වසරක කාලයක් සඳහා විශේෂ තාවකාලික අනුමැතිය ලබා දිය හැකිය.

## ව්‍යාපෘති සංවර්ධනය කිරීම

16. ඉහත දැක්වෙන 2වන ඡේදය අනුව අවලංගු කරන ව්‍යාපෘති සහ එම අවලංගු කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත්කර උපදේශක කමිටුව මගින් පවත්වාගෙන යාම සඳහා නිර්දේශ නොකරන ව්‍යාපෘති සහ 10 වන ඡේදය අනුව අවලංගු කරන ව්‍යාපෘති සහ එම අවලංගු කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව මගින් නිර්දේශ නොකරන ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් කළමනාකරණ මණ්ඩලය මගින් සකස් කළ යුතුය.

17. මෙහි 9 වන ඡේදය යටතේ දීර්ඝ කර ඇති නමුත් විශේෂ බලපත්‍රය දීර්ඝ කරන ලද කාලසීමාව තුළ විදුලිය ජනනය කිරීමට අපොහොසත්වන ව්‍යාපෘතිවලට සහ මෙහි 15 වන ඡේදය යටතේ නිකුත් කරන ලද විශේෂ තාවකාලික අනුමැතිය නිකුත් කර වසරක කාලයක් තුළ බලපත්‍රය ලබා ගැනීමට අපොහොසත්වන ව්‍යාපෘතිවලට අදාළ ව්‍යාපෘති ස්ථාන පනතේ 30 (1) වගන්තිය අනුව පවරාගෙන විවෘත ලංසු කැඳවීම මගින් සුදුසු ආයෝජකයන් තෝරා සංවර්ධනය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය හා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ඒකාබද්ධව පියවර ගත යුතුය.

18. ඉහත සඳහන් 17 වන ඡේදය යටතේ ව්‍යාපෘති ස්ථාන පවරාගනු ලබනවිට, පනතේ 30 (2) වගන්තිය අනුව ගණනය කරනු ලබන වන්දි මුදලක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් අදාළ පාර්ශවයන්ට ගෙවිය හැකිය.

19. මෙම චක්‍රලේඛය යටතේ අවලංගු කරන ව්‍යාපෘති සඳහා ලබාදී ඇති අනුමැතීන් ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමට ඉදිරිපත්වන වෙනත් සංවර්ධනකරුවෙකුට භාවිත කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය මගින් සුදුසු පරිදි අවස්ථාව ලබා දිය හැකිය.

20. උපදේශක කමිටුව මගින් සහ ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව මගින් නිර්දේශ නොකරනු ලබන ව්‍යාපෘති ස්ථාන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා සුදුසු නොවන ස්ථාන වශයෙන් කළමනාකරණ මණ්ඩලය විසින් ගැසට් කළ යුතුය.

21. මෙහි 2 වන ඡේදය අනුව අවලංගු කරන ව්‍යාපෘති සහ එම අවලංගු කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත්කර උපදේශක කමිටුව මගින් පවත්වාගෙන යාම සඳහා නිර්දේශ නොකරන ව්‍යාපෘති සහ 10 වන ඡේදය අනුව අවලංගු කරන ව්‍යාපෘති සහ එම අවලංගු කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව මගින් නිර්දේශ නොකරන ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත දැනුම් දිය යුතුය.

**<u>විදුලිබල මණ්ඩලයේ ප්‍රතිචාර කඩිනම් කිරීම</u>**

22. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරියට ලැබෙන අයදුම්පත්‍රයකට තාවකාලික අනුමැතිය ලබා දීමට පෙර පනතේ 17 වන වගන්තිය යටතේ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ජාල යෝජනාව අනුමත කළ යුතුය. මෙම ජාල යෝජනා අනුමැතිය ලබාදීම ප්‍රමාදවීම නිසා බොහෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වන බව නිරීක්ෂණය වී ඇත. මේ නිසා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ව්‍යාපෘති සඳහා ජාල යෝජනා අනුමත කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට යවන ලිපි සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මගින් මාස 2ක් ඇතුළත ප්‍රතිචාර ලබා දිය යුතුය.

    ලංකා විදුලිබල මණ්ඩලය මගින් මාස 2ක් ඇතුළත ප්‍රතිචාර නොලැබෙන අවස්ථාවකදී ලංකා විදුලිබල මණ්ඩලයෙන් ජාල යෝජනාව ලැබුනා සේ සළකා ව්‍යාපෘතිය අනුමත කිරීමේ කමිටුව වෙත යොමුකළ යුතුය. ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුවේ ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාජිකයෙක් සිටින බැවින් අදාළ ව්‍යාපෘතියෙන් විශාල තාක්ෂණික ගැටළුවක් ඇති වන්නේ නම් පමණක් ජාල යෝජනාව ලබා දීම සඳහා තවත් මසක කාලයක් ඉල්ලා සිටිය හැකිය.

**<u>ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රමවේද වඩා ඵලදායී මට්ටමට ගෙන ඒම</u>**

23. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමත කිරීම සම්බන්ධව දැනට ක්‍රියාත්මක ක්‍රමවේදය අනුව ඇතැම් අවස්ථාවල ව්‍යාපෘති සඳහා ජාලය ලබා දීමේදී සහ ජාල යෝජනාව ලබා දීමෙන් අනතුරුවත් අදාළ ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම අනවශ්‍ය ලෙස ප්‍රමාද වීම නිසා වෙනත් ව්‍යාපෘතියකට ජාල යෝජනාව ලබා ගැනීමට නොහැකි වීම බහුලව දක්නට ලැබේ. එබැවින් දැනට පවතින පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රමවේදය අනවශ්‍ය ලෙස සංකීර්ණ ක්‍රමවේදයක් මෙන්ම ඵලදායී ක්‍රමවේදයක් ද නොවන බව පැහැදිළි වේ.

    පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලිය ඉතාමත් සංකීර්ණ ක්‍රමයක් බැවින් සැබෑ ආයෝජකයන්ට කිසිම ආකාරයකින් අවශ්‍ය අනුමැතීන් සහ බලපත්‍ර ලබා ගැනීමට නොහැකි බවත් ඒ හේතුවෙන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධන ක්‍රියාවලිය අපේක්ෂිත මට්ටමට සිදු නොවන බවත් වාර්තා වී ඇති හෙයින් සැබෑ ආයෝජකයන්ට ඉතාමත්ම කෙටි කාලයක් තුළ අන්තර්ජාලය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීම වැනි සරල ක්‍රමවේද හරහා අදාළ අනුමැතීන් ලබා දීමට අවස්ථාව සලසා දීම කාලීන අවශ්‍යතාවයකි. එබැවින් සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඒ සම්බන්ධව අවධානය යොමුකර පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමැතිය සඳහා ඉදිරියේදී වඩා සරල ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගත යුතුය.

**<u>චක්‍රලේඛය ක්‍රියාත්මක වීම</u>**

පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කඩිනම් කිරීම සම්බන්ධ මෙම චක්‍රලේඛය 2016 මාර්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක වේ.

**රංජිත් සියඹලාපිටිය (පා.ම.)**
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය

පිටපත් :- 01. ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා - දැ.ගැ.ස.
02. ලේකම්, මුදල් අමාත්‍යාංශය - දැ.ගැ.ස.
03. ලේකම්, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය - දැ.ගැ.ස.
04. සභාපති, ලංකා විදුලිබල මණ්ඩලය - අවශ්‍ය පියවර ගැනීම සඳහා
05. සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය - අවශ්‍ය පියවර ගැනීම සඳහා
06. අධ්‍යක්ෂ ජනරාල්, සුනිත්‍ය බලශක්ති අධිකාරිය - අවශ්‍ය පියවර ගැනීම සඳහා
07. සභාපති, ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව - අවශ්‍ය පියවර ගැනීම සඳහා